සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2025 ජූලි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

2025-08-02
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, භූමිය සඳහා වන ප්‍රතිලාභය කුමක් ද?

(1) ලාභය. (2) පොලිය. (3) කුලිය. (4) වේතන.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) අවශ්‍යතා අසීමිත වන අතර වුවමනා සීමිත වේ.

(2) හිඟකම, තේරීම්වලට හේතු වේ.

(3) ආර්ථික සම්පත් සඳහා සැපයුමෙහි හිඟකමක් නොමැත.

(4) සම්පත්වල විකල්ප ප්‍රයෝජන තිබෙන විට ආවස්ථික පිරිවැය ශූන්‍ය වේ.

1.3 **A** සහ **B** භාණ්ඩ අතර, හරස් ඉල්ලුම් නම්‍යතා සංගුණකය ධන වේ නම්, මෙම භාණ්ඩ:

(1) අනුපූරක භාණ්ඩයි (Complementary Goods). (2) සාමාන්‍ය භාණ්ඩයි (Normal Goods).

(3) බාල භාණ්ඩයි (Inferior Goods). (4) ආදේශක භාණ්ඩයි (Substitute Goods).

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, වෙළෙඳපොළ ආර්ථිකයකට රජය මැදිහත් වීමට ප්‍රධාන හේතුව වන්නේ කුමක් ද?

(1) ලාභය උපරිම කිරීමට.

(2) පාරිභෝගිකයින් / නිෂ්පාදකයින් ආරක්ෂා කිරීමට.

(3) පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා සුරක්ෂිත කිරීමට.

(4) ඉහත සඳහන් සියල්ලම.

1.5 2024 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික සමාලෝචනයට අනුව, 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතය වූයේ:

(1) −7.3%. (2) −2.3%. (3) 5%. (4) 1.5%.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයක ලක්ෂණ සම්බන්ධයෙන් **වැරදි** ප්‍රකාශය කුමක් ද?

(1) පෞද්ගලික ව්‍යවසායක ක්‍රමයක් පැවතීම. (2) පාරිභෝගික ස්වාධිපත්‍යයක් පැවතීම.

(3) සාධාරණ ආදායම් ව්‍යාප්තියක් පැවතීම. (4) තේරීමේ නිදහසක් පැවතීම.

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, ඒකාධිකාරී තරඟකාරී වෙළෙඳපොළක් සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) කර්මාන්තය තුළ ආයතන විශාල සංඛ්‍යාවක් පැවතීම.

(2) වෙළෙඳපොළ තුළට නිදහසේ පිවිසීමට හැකිවීම.

(3) දිගු කාලයේදී ප්‍රාමාණික ලාභ / ශුන්‍ය ආර්ථික ලාභ ලැබීම.

(4) ඉහත සඳහන් සියල්ලම.

1.8 සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ [Average Total Cost (ATC)] අවම ලක්ෂයේදී, ආන්තික පිරිවැය [Marginal Cost (MC)] :

(1) සාමාන්‍ය මුළු පිරිවැයට සමාන වේ. (2) සාමාන්‍ය ස්ථාවර පිරිවැයට සමාන වේ.

(3) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන වේ. (4) සාමාන්‍ය මුළු පිරිවැයට වඩා වැඩි වේ.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, සැපයුම් ප්‍රමාණයේ ප්‍රසාරණය (expansion of quantity supplied) සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) සැපයුම් වක්‍රය දිගේ පහළට ගමන් කරයි. (2) සැපයුම් වක්‍රය දිගේ ඉහළට ගමන් කරයි.

(3) සැපයුම් වක්‍රය වමට විතැන් වීම. (4) සැපයුම් වක්‍රය දකුණට විතැන් වීම.

**1.10** පහත සඳහන් ඒවා අතුරෙන්, කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිවැරදි **නොවන්නේ** කුමක් ද?

(1) යෙදවුම්වල විචල්‍ය සාධක පැවතීම.

(2) නිෂ්පාදන සාධක, විචල්‍ය සහ ස්ථාවර සාධක වශයෙන් බෙදා දක්වයි.

(3) යෙදවුම්වල ස්ථාවර සාධක නොමැත.

(4) ආයතනවලට නිෂ්පාදනය ප්‍රසාරණය කිරීමේ නම්‍යතාවයක් නොමැත.

*අංක 1.11 සහ 1.12 ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින්, නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමඟ, උත්තර පොතේ ලියන්න.*

**1.11** …………… *[සංඛ්‍යා සූචක (Cardinal) / ක්‍රම සූචක (Ordinal)]* උපයෝගිතා න්‍යාය අනුව, තෘප්තිය මැනිය නොහැක.

**1.12** තාක්ෂණය …………… *(නොවෙනස්ව පැවතීම / වෙනස්වීම),* නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ උපකල්පනයකි.

*අංක 1.13 සහ 1.14 ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.13** දී ඇති කාල පරිච්ඡේදයක් තුළ නිමැවුම් ඒකකයක පිරිවැය, ආන්තික පිරිවැය ලෙස හඳුන්වනු ලැබේ.

**1.14** පූර්ණ තරඟකාරී ආයතනයක්, දිගු කාලයේදී ප්‍රාමාණික / ශූන්‍ය ආර්ථික ලාභ ලබයි.

*අංක 1.15 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.15** "සාර්ව ආර්ථික විද්‍යාව" (Macro Economics) සහ "සූක්ෂම ආර්ථික විද්‍යාව" (Micro Economics) අතර ඇති වෙනස සඳහන් කරන්න.

**1.16** උද්ධමනය ඇතිවීමට බලපාන ප්‍රධාන හේතු දෙක(02) සඳහන් කරන්න.

**1.17** සැපයුම් නීතිය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.18** සැපයුම් වක්‍රය, වමට විතැන් වීම සඳහා හේතු දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.19** "තිරසාර සංවර්ධනයේ" (sustainable development) ආර්ථික පැතිකඩ තුළ ඇතුළත් අයිතම දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.20** මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රමාණාත්මක උපකරණයක් ලෙස විවෘත වෙළෙඳපොළ කටයුතු යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) ආර්ථික නොවන භාණ්ඩවල ලක්ෂණ තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) සැලසුම්ගත ආර්ථික ක්‍රමයක ලක්ෂණ තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(c) ඒකාධිකාරී වෙළෙඳපොළක ලක්ෂණ දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

(a) භාණ්ඩයක් සම්බන්ධයෙන් පහත සඳහන් ඉල්ලුම් ශ්‍රිතය ($Q_d$) සහ සැපයුම් ශ්‍රිතය ($Q_s$) සලකා බලන්න:

$$Q_d = 2,800 - 25p$$

$$Q_s = -200 + 100p$$

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) භාණ්ඩයේ වෙළෙඳපොළ සමතුලිත මිල සහ ප්‍රමාණය **ගණනය කරන්න.** (ලකුණු 04)

(ii) නිෂ්පාදන අතිරික්තය **ගණනය කරන්න.** (ලකුණු 02)

(b) රජය විසින් භාණ්ඩයක සමතුලිත මිලට ඉහළින් අවම මිලක් පැනවීමෙන් ඇතිවන ප්‍රතිවිපාක **පැහැදිලි කරන්න.**

(ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

(a) ආසන්න මුදල් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද යන්න උදාහරණයක් සමඟ **පැහැදිලි කරන්න.** (ලකුණු 02)

(b) මුදලට ඇති ඉල්ලුමට බලපාන චේතනා (motives) දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) පහත සඳහන් දත්ත ඔබ වෙත සපයා ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| මහජනයා සතු ව්‍යවහාර මුදල් | 15,600 |
| වාණිජ බැංකුවල මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | 27,600 |
| වාණිජ බැංකුවල මහජනයා සතු කාලීන සහ ඉතුරුම් තැන්පතු | 14,800 |
| නේවාසිකයන් සතු විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල ඇති කාලීන සහ ඉතුරුම් තැන්පතු | 8,600 |

ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව,

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(i) පටු මුදල් සැපයුම [Narrow Money Supply ($M_1$)]. (ලකුණු 02)

(ii) පුළුල් මුදල් සැපයුම [Broad Money Supply ($M_2$)]. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

(a) නිරපේක්ෂ වාසි න්‍යාය (Absolute Advantage Theory) යනුවෙන් අදහස් වන්නේ කුමක්ද යන්න උදාහරණයක් සමග **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) අන්තර්ජාතික වෙළඳාමේ අවාසි තුනක්(03) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 03)

(c) ඇමරිකානු ඩොලරයට (US Dollar) එරෙහිව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිවිපාක දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

(A) නිෂ්පාදකයාගේ මිල සහ ගැනුම්කරුවාගේ මිල අතර ඇති වෙනස **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(B) කිසියම් ආර්ථිකයක වසරක කාලයක් සඳහා ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් උපකල්පිත දත්ත ඔබ වෙත ලබාදී ඇත:

| | **රු. මිලියන** |
|---|---:|
| පෞද්ගලික පරිභෝජන වියදම | 5,000 |
| රජයේ පරිභෝජන වියදම | 7,000 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 2,500 |
| තොග වෙනස්වීම් | 300 |
| වටිනාකම්හි වෙනස්වීම් | 245 |
| භාණ්ඩ හා සේවා අපනයන | 4,500 |
| භාණ්ඩ හා සේවා ආනයන | 13,000 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | 500 |

**ඔබ විසින් කල යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න:**

(a) වෙළෙඳපොල මිලට දළ දේශීය වියදම [Gross Domestic Expenditure (GDE)]. (ලකුණු 06)

(b) වෙළෙඳපොල මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 03)

(c) වෙළෙඳපොල මිලට දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

(C) ජාතික ගිණුම් පිළියෙල කිරීමේ වැදගත්කම් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(D) රජයක අසමත්වීම්වලට හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

## කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැළකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමඟ අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙළ කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමඟ ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |